# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1645/4 - 2010 මාර්තු 15 වැනි සඳුදා - 2010.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වෙරළ සංරක්ෂණ පනතේ 16 වන වගන්තියේ 2(ආ) වන උපවගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත නිවාඩු නිකේතන ව්‍යාපෘතිය, පාසිකුඩා - මඩකලපුව පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 16 (1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව නො : 80, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද යෝජිත "පාසිකුඩා නිවාඩු නිකේතන ව්‍යාපෘතිය " සඳහා වූ පාරිසරික ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප. ව. 4.15 දක්වා 2010.03.17 දින සිට දින 30ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන්හි පරීක්ෂා කළ නොහැක.)

| | | | |
|---|---|---|---|
| 1. | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය | - | නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 |
| 2. | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | - | නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10 |
| 3. | මධ්‍යම පරිසර අධිකාරිය | - | පරිසර පියස, නො 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල |
| 4. | නාගරික සංවර්ධන අධිකාරිය | - | සෙත්සිරිපාය, බත්තරමුල්ල |
| 5. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | - | මඩකලපුව |
| 6. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - | වාලච්චේන |
| 7. | ප්‍රාදේශීය සභාව | - | වාලච්චේන |
| 8. | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | - | දිස්ත්‍රික් ධීවර කාර්යාලය, මඩකලපුව |

මෙම යෝජිත පාසිකුඩා නිවාඩු නිකේතන ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2010.03.17 දින සිට දින 30ක් ඇතුළත වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

අනිල් ප්‍රේමරත්න,
වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ.

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල, මාලිගාවත්ත,
කොළඹ 10.

දුරකථන අංක : 011 - 2449754, 011 - 2387922, 011 - 2472623
ෆැක්ස් අංක : 011 - 2438005, 011 - 2472623

04-09

1A - G 12604— 380 (2010/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.